SEC | SECURITIES AND EXCHANGE COMMISSION OF SRI LANKA

# මාධ්‍ය නිවේදනය

## 2018 ජනවාරි 24 දින

**අධ්‍යාපන අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අවබෝධතා ගිවිසුමකට අත්සන් තබයි.**

**අ.පො.ස.(උ.පෙළ) සිසුන් සඳහා ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ අත්පොතක්.. ..**

ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමන ආයතනය ලෙස, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ එක් අරමුණක් වනුයේ වෙළෙඳපොළ තුළ වෘත්තීය ප්‍රමිතීන් පවත්වාගෙන යාමයි. එමෙන්ම ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය කිරීමද තවත් එක් අරමුණකි. වර්තමානය වන විට ඒ යටතේ කර්මාන්තයේ නියුතු ආයතනවල නිලධාරීන්ගේ, ව්‍යාපාරිකයන්ගේ, රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතනවල නිලධාරීන්ගේ, විශ්ව විද්‍යාල සිසුන්, ගුරුභවතුන් මෙන්ම පාසල් සිසුන්ගේ ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ දැනුම ඉහළ නැංවීම සඳහා විවිධාකාරයේ දැනුවත් කිරීමේ වැඩසටහන් අඛණ්ඩව සිදුකරගෙන යනු ලබයි.

එහි ඉදිරි පියවරක් වශයෙන් දිවයින පුරා පිහිටි සියළු අධ්‍යාපන කලාපවල අ.පො.ස.(සා.පෙළ) සහ අ.පො.ස.(උ.පෙළ) වාණිජ සහ ගිණුම්කරණ විෂයයන් උගන්වනු ලබන ගුරුභවතුන් සහ වාණිජ සහ ගිණුම්කරණය විෂයයන් හදාරණ ශිෂ්‍ය, ශිෂ්‍යාවන් සඳහා භාෂා ත්‍රිත්වයම ආවරණය වන අයුරින් නව දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් දියත් කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව කටයුතු සූදානම් කර ඇති අතර එය ක්‍රියාවට නැංවීමේ අවබෝධතා ගිවිසුමට අධ්‍යාපන අමාත්‍යාංශයේදී, 2018 ජනවාරි මස 24 වන දින අධ්‍යාපන අමාත්‍යාංශය වෙනුවෙන් එහි ලේකම්, සුනිල් හෙට්ටිආරච්චි මහතාත්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වජිර විජේගුණවර්ධන මහතාත් අත්සන් ලබන ලදි.

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වර්තමානය වන විට දිවයින පුරා කලාප අධ්‍යාපන කාර්යාල 98ක් ක්‍රියාත්මක වේ. එම අධ්‍යාපන කලාප සියල්ලෙහි වාණිජ විෂය භාර ගුරුභවතුන් සහ වාණිජ විෂය හදාරණ ශිෂ්‍යාවන්ට, උසස් පෙළ ව්‍යාපාර අධ්‍යයනය විෂය නිර්දේශයට අදාළ "ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ" මාතෘකාව ආවරණය වන අයුරින් මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාව සකස් කර ඇත. තුන් අවුරුදු දැනුවත් කිරීමේ සැළැස්මකට අනුව සකස් කළ අවබෝධතා ගිවිසුම මගින් 2018 වර්ෂයද ඇතුළත්ව එක් අවුරුද්දක් තුළ ගුරුභවතුන් සඳහා වැඩසටහන් 32ක්ද සහ සිසුන් සඳහා වැඩසටහන් 32ක්ද සංවිධානය කිරීමට සැලසුම්කර ඇති අතර 2020 වසර අවසානය වන විට සියළු අධ්‍යාපන කලාප ආවරණය කර අවසන් කරනු ඇත. ඉන් අනතුරුව නැවතත් එම මෙම ගිවිසුම අළුත් කිරීමටද අපේක්ෂා කරයි.

මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා කර්මාන්තයේ නියතු ඉහළ පෙළේ වෘත්තිකයන් සම්පත් දායකයන් ලෙස යොදා ගැනෙන අතර නව තාක්ෂණය සමඟ පැවැත්වෙන දේශන,

අත්පත්‍රිකා බෙදාහැරීම, කොටස් වෙළෙඳපොළ සම්බන්ධ ප්‍රායෝගික දැනුම ලබාදීම ද එම වැඩසටහන්වලට අන්තර්ගත කොට ඇත.

මෙම අවබෝධතා ගිවිසුම අනුව ගුරුභවතුන්ගේ සහ සිසුන්ගේ දැනුම ඉහළ නංවා ගැනීමට පමණක් නොව විෂය නිර්දේශයට අනුව ප්‍රාග්ධන වෙළෙඳපොළ සම්බන්ධයෙන් සකස් කළ අත්පොතක් සකස් කර සිසුන් අතට පත්කිරීමටද සැළසුම්කර ඇත. මීට අමතරව අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය යටතේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අ.පො.ස.(උ.පෙළ) වාණිජ සහ ආර්ථික විද්‍යා විෂයයන් හදාරණ සිසුන් අතර දීප ව්‍යාප්ත අන්තර් පාඨශාලීය"කොටස් වෙළෙඳපොළයි ඔබයි" රූපවාහිනී ප්‍රශ්ණ විචාරාත්මක දැනුම මිනුම තරඟයක්ද පැවැත්වීමට සූදානම් කර ඇත.

මේ අනුව අනාගතයේදී කොටස් වෙළෙඳපොළ, ණයකර වෙළෙඳපොළ, ඒකක භාර වෙළෙඳපොළ ඇතුළු සමස්ත ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ දැනුවත් ප්‍රජාවක් බිහිකිරීමේ පරමාර්ථය යථාර්ථයක් බවට පත් කිරීමේ වෑයමෙහි නව පරිච්ඡේදයක ඇරඹුමක් ලෙස මෙම අවබෝධතා ගිවිසුම පෙන්වා දිය හැකිය.

**ජායාරූප 2222**

සුනිල් හෙට්ටිආරච්චි මහතා- ලේකම් (අධ්‍යාපන අමාත්‍යාංශය), වජිර විජේගුණවර්ධන මහතා- අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව)

**ජායාරූප 1450**

වමේ සිට..

නිමල් කුමාරසිංහ මහතා- ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකරු (ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව), එස් එන් මලවිආරච්චි මිය - නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂිකා ( ව්‍යාපාර අධ්‍යයන ඒකකය- අධ්‍යාපන අමාත්‍යාංශය), ඩබ්. එම්. එන්. ජේ. පුෂ්පකුමාර මහතා- අධ්‍යාපන අධ්‍යක්ෂ (ව්‍යාපාර අධ්‍යයන ඒකකය- අධ්‍යාපන අමාත්‍යාංශය), සුනිල් හෙට්ටිආරච්චි මහතා- ලේකම් (අධ්‍යාපන අමාත්‍යාංශය), වජිර විජේගුණවර්ධන මහතා- අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව), තුෂාර ජයරත්න මහතා- අධ්‍යක්ෂ ( බාහිර සම්බන්ධතා සහ ආවේක්ෂණ අංශය, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව), එම් එම් ඒ ඉම්රාන් මහතා - සහකාර කළමනාකරු (ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව)


**Issued by**

Director, External Relations and Surveillance

SEC SECURITIES AND EXCHANGE COMMISSION OF SRI LANKA

Level 28-29, East Tower, World Trade Center
Echelon Square, Colombo 01, Sri Lanka
Phone: (+94 11) 2143843 ext 190
Direct (+94 11) 2143834
Fax : (+94 11) 2439149
E-Mail: tushara@sec.gov.lk
Website: http://www.sec.gov.lk